# 6. "උසුලුල් ෆික්හ්" (මසාදිරුෂ් ෂරීආ)

## 6.1 අල්කුර්ආන්-නීති මූලාශ්‍රය

අල්කුර්ආනය අල්ලාහ්ගේ වචන වන්නේය. අල්ලාහ් එය තම අවසන් දූතයා වූ මුහම්මද් (සල්) තුමාණන්ට අවසන් ආගම වශයෙන් පහළ කළේය. අල්කුර්ආන් යන වචනය "පාරායන කිරීම" යන අදහස් ගෙනෙයි. අල්ලාහ්ගේ වාක්‍යයන් වූ හුදෙක් පාරායනය කිරීමද ආනිසංස ගෙන දෙන්නකි. අල්කුර්ආනයෙහි අඩංගුවන ඉතා කුඩාම පරිච්ඡේදය වැනි එකක් නිර්මාණය කිරීමට මේ දක්වා කිසිවෙකුටත් හැකියාව ලැබී නැත. මෙය අල්කුර්ආනයේ අග්‍රගන්‍යභාවයට කදිම උදාහරණයකි. ඉස්ලාමීය නීති මූලාශ්‍රයන්ගෙන් ප්‍රථම ස්ථානය අල්කුර්ආනයට හිමි වේ.

අල්කුර්ආනය ප්‍රථමයෙන්ම "හිරා" නම් ගුහාවේ නබී (සල්) තුමාණන්ට පහළ කරනු ලැබීය. මෙය රමළාන් මාසයේ ශුද්ධ වූ "ලෛලතුල් කද්ර්" නම් රාත්‍රියෙහි සිදුවූවකි. එතැන් පටන් කලින් කලට අවස්ථානුකූලව වසර විසිතුනක් වැනි කාලයක් තිස්සේ අල්ලාහ් "ජිබ්රීල්" නම් දේව දූතයා මගින් නබි මුහම්මද් (සල්) වෙත පියවරෙන් පියවර පහළ කෙරුවේය. සහාභාවරු පහළ කරනු ලැබූ වාක්‍යයන් කට පාඩම් කර, ක්‍රියාවට නංවා හා සමහරු ලියා තබා ආරක්ෂා කළහ. කලීෆා අබුබක්කර් (රලි) තුමාගේ සමයේ අල්කුර්ආනය ප්‍රථමයෙන් ග්‍රන්ථාරූඪ කරන ලදී. පසුව කලීෆා උස්මාන් (රලි) තුමාගේ කාලයේ අල්කුර්ආනය පිටපත් කිහිපයකට ලියා ඉස්ලාමීය රාජ්‍ය පුරා යවන ලදී.

අල්කුර්ආනය විශ්වය හා එහි ජිවීන් මවනු ලැබූ අල්ලාහ් විසින් පහළ කරන ලද්දෙකි. ඔහු මිනිසාව මැව්වේය. මිනිසාගේ දුර්වලකම් හා ස්වභාවය යහතින් හඳුනන්නේය. ඔහු අතීත, වර්තමාන, අනාගත කාලයන් ගැන මනා අවබෝධයක් ඇත්තෙකි. කිසිම අඩුපාඩුවක් දක්නට නොලැබුවෙකි. එවැන්නෙකු විසින් දායාද කරන ලද නීති සංග්‍රහය ද කිසිම අඩුපාඩුවකින් තොරය. මුළු මහත් මිනිස් සමාජයටම එය අනුගමනය කළ හැක.

අල්කුර්ආනය සියළු වකවානුවන්ට, සියළු ප්‍රදේශයන්ට හා සියළු වාතාවරණයන්ට උචිත වූ අනුශාසනාවන් ගෙන හැර දක්වයි. මේ නිසා අල්කුර්ආනය විසින් පරිනමනු ලබන නීති හා නියමයන් නබි(සල්) තුමාණන්ගේ කාලයේ සිට ලොව විනාශය සිදුවන තාක් කල් පිළිපැදීමට සුදුසු වන්නේය.

තවද, අල්කුර්ආනය සුරක්ෂිත බවද අල්ලාහ් තරයේ ප්‍රකාශ කරයි. එය සැමදා අල්ලාහ් විසින් සුරැකෙනු ඇත. අල්ලාහ් එය සුරකින බැව් ප්‍රතිඥා දෙයි. මෙතෙක් එහි අංශු මාත්‍රයක තරම් හෝ වෙනස්කමක් සිදුවී නැත. මෙයද අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් ලෙස ගැනෙන්නට කදිම නිදසුනකි.

අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් වශයෙන් පිළිගන්නා ලෙස පහත සඳහන් අල්කුර්ආනය හා හදීස් වැකි වලින් අපට අවවාදයන් ලබා දී ඇත.

"මිනිසුනි ! නුඹලාගේ ස්වාමියාගෙන් නුඹලාට උපදේශයන් ලැබී ඇත. එය ළයෙහි ලෙඩ රෝගවලට පිළිමයකි. තවද විශ්වාසවන්තයින් හට යහමග පෙන්වන්නක් ද, දායාදයක් වන්නේය." (10:57)

"යම් කෙනෙකු අල්ලාහ් පහළ කළ දැයින් විනිශ්චය නොකළාහු නම් ඔවුහු අපරාධ කරුවන්ය." (5:45)

"යම් කෙනෙකු අල්ලාහ් පහළ කළ දෑයින් විනිශ්චය නොකරන්නාහු නම්, ඔව්හු ප්‍රතික්ෂේප කරන්නෝය." (5:44)

නබි (සල්) තුමාණන් විටක, "මා ඔබ ළඟ දායාදයන් දෙකක් ඉතිරි කර තබන්නෙමි. එම දායාදයන් අනුග මනය කරන තාක් කල් ඔබ නිසි මාර්ගයෙහි යන්නෙහිය. එය නම් අල්ලාහ්ගේ ආගම හා මගේ පිළිවෙත්ය" යයි පවසා සිටියහ. (අල් හදීස්)

අල්කුර්ආනයේ නීති හා අණ ඉතා පැහැදිලි හා ස්ථිරසාර වේ. මිනිස් ජීවිතයේ සියලු පැතිකඩයන්ට උචිත වේ. එය නිසි මාර්ගය පහදා දෙන්නේය. වත් පිළිවෙත්, ගති ගුණයන්, විශ්වාසය, යථාර්ථයන්, ගනුදෙනු සමාජීය බැඳීම්, කුසල්-අකුසල්, නීති, දඬුවම්, යුද්ධ සංකල්ප, සාම ප්‍රයත්නයන් හා ජාත්‍යන්තර සබඳතා වැනි ලෞකික ජීවිතයේ සියළු කොටස් ගැන පැහැදිලි කරයි. මේ නිසා ඉස්ලාම් අල්කුර්ආනය ප්‍රථම නීති මූලාශ්‍රය ලෙස පිළිගැනෙනු ලබන්නේය.

මනුෂ්‍ය ජීවිතයට අවශ්‍ය සියළු අනුශාසනාවන්, මග පෙන්වීම් හා ශිල්පයන් අල්කුර්ආනය තුළ අන්තර්ගත වී ඇති හෙයින් අල්ලාහ් හා සම්බන්ධ වූ අංග සම්පූර්ණ ග්‍රන්ථයක් ලෙස එය හැඳින්විය හැක.

අල්කුර්ආනයේ පරිච්ඡේද 114 කින් සමන්විතය. සුරතල් බකරාව ලොකුම පරිච්ඡේදය වන අතර එය වාක්‍ය 286 කින් සමන්විතය. එලෙසම ඉතා කුඩාම පරිච්ඡේදය වන සූරා අල් කව්සර් වාක්‍ය 3 කින් පමණක් සමන්විතය.

වුළූඃ කළ පසු අල්-කුර්ආනය ඇල්ලීමත්, අල්-කුර්ආනය පාරායනය කරන විට එයට සවන් දීමත්, අක්ෂර උච්චාරණයේ දී " තජ්වීද් " අනුව පරායනය කිරීමත් වැදගත් වේ. සමහර සූරාවන් පාරායනය කරන ලෙස හදීස්හි වල කර පවසා තිබෙනු දැකිය හැකිය.

සූරා අස් - සජදා
සූරා අල් - මුල්ක්
සූරා අල් - බකරා
සූරා - යාසීන්
සූරා අල් - වාකිආ
සූරා අල් - රහ්මාන්

අභ්‍යාසය

කෙටි පිළිතුරු සපයන්න.

1. ඉස්ලාමයේ ප්‍රථම නීති මූලාශ්‍රය කුමක් ද?
2. අල්කුර්ආනය වර්තමානය දක්වා ආරක්‍ෂා කරන ලද ක්‍රම සඳහන් කරන්න.
3. අල්කුර්ආන් නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමට සාධක දක්වන්න.
4. අල්කුර්ආනයේ විශාලතම සූරාව කුමක් ද?
5. අල්කුර්ආනයේ ඇති පරිච්ඡේද ගණන කීයද?

# 6.2 සුන්නාහ්-නීති මූලාශ්‍රය

හදීස් යන පදයට "ප්‍රවෘත්තිය", "සිද්ධිය" යයි අර්ථවත් කළ හැක. සුන්නාහ් යන්නට "හැසිරීම" යන අදහසක් ද දෙනු ලබන්නේය. සුන්නාහ් යනු නබිතුමාණන්ගේ ජීවන රටාව කියා පාන කොටසක්ය. ඉස්ලාමයේ වැදගත් මූලාශ්‍රයක් ලෙස සුන්නාහ්ව පිළිගෙන ඇත. සුන්නාහ්, හදීස් යන්න නබි (සල්) තුමාණන්ගේ පැවසුම්, ක්‍රියාවන්, අනුමත කළ දෑ හා ගුණාංගයන් වන්නේය.

අල්-කුර්ආනය නිසියාකාරව වටහාගෙන පිළිපැදීමට සුන්නාහ් රුකුලක් වන්නේය. අල්කුර්ආනය සේම සුන්නාහ්වත් නීති මූලාශ්‍රයක් ලෙස පිළිගන්නා ලෙස අවවාද කර ඇත.

"යමෙකු අල්ලාහ්ගේ දූතයාට අවනත වන්නෙහිද නිශ්චිත වශයෙන් ම ඔහු අල්ලාහ්ට අවනත වන්නෙකි" (4 : 80)

"අපගේ දූතයා ඔබට ලබාදුන් දේ පිළිපදින්න. ඔහු වළකා ලූ දෙයින් වැළකී සිටින්න." (3 : 32)

"නබිවරයාණෙනි! ඔබ පවසනු අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට කීකරු වන්න. අකීකරු වන්නා අල්ලාහ්ට ප්‍රියවන්නත් නොවන්නෝය" (අල්කුර්ආන්)

ඉහත කුර්ආන් වාක්‍යය නබිතුමාණන්ගේ මාර්ගෝපදේශයන් පිළිපැද ජීවත්වන ලෙස අපට අණ කර සිටී.

"මගේ අනුගාමිකයන් සියලු දෙනා ස්වර්ගයට පිවිසෙන්නෝය. සත් මාර්ගය නොපිළිගත් අය හැර" යයි නබි (සල්) තුමාණන් පැවසූ විට නොපිළිගත්තේ කවුරුන් දැයි විමසූ විට නබි (සල්) තුමාණන් "මට අවනත වූවන් ස්වර්ගයට පිවිසෙන්නෝය. වෙනස් කම් කළවුන්, නොපිළිගත් අය වන්නෝය." (බයිහකි) යයි විග්‍රහ කළහ.

අල්-කුර්ආනය විශ්වයටම දේශනාවකි. එය විග්‍රහ කර ජීවත් වූ රසූල් (සල්) තුමාණන් විශ්වයටම දයාදයකි. අල්කුර්ආනය මිනිස් සමාජයටම යහපත් මාර්ගය පෙන්වන්නකි. නබි (සල්) තුමාණන් මුළු මහත් ලෝකයටම දේව දූතයෙකි. මේ නිසා හදීසය නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇත්තේය.

නබි (සල්) තුමාණන්ගේ ජීවිතයෙන් ලබාගත් හදීසයන් සහාභාවරු ක්‍රියාවට නැංවූහ. කටපාඩම් කළහ. සමහරුන් ලියා තැබූවෝය. කුර්ආනය සේ හදීස් සම්පූර්ණයෙන් උපුටා ගොනු නොකරන ලදී. එනමුත් මතු පරපුර වෙනුවෙන් හදීසයන් ආරක්ෂා කරන ලදී. තාබිඊන්වරුන්ගේ කාලයේ හදීස් ග්‍රන්ථාරූඪ කිරීම සඳහා ප්‍රයත්නයක් දරණ ලදී. මෙම උත්සාහය තබඋත්තාබිඊන් කාලයේ තවත් උත්සන්න විය. ව්‍යාජ හදීස් හඳුනා ගැනීම්. හදීස් වර්ගීකරණය, හදීස් ග්‍රන්ථාරූඪ කිරීම්, හදීස් විස්තර කිරීමේ ග්‍රන්ථ එළිදැක්වීම් යන සියළු කොටස් එක් තැන් කර ලියා ප්‍රසිද්ධ කරන ලද අස්සිහාහුස් සිත්තා සහ වෙනත් හදීස් ග්‍රන්ථ මාලාවන් හදීස් ගැන පැහැදිලි විස්තර ලබා දී නීති මූලාශ්‍රයන් සකස් කිරීමට ඉවහල් වන්නේය.

අල්කුර්ආනය අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ දේව වාක්‍යය සේම හදීස් ද එවැන්නකි. මෙය පහත සඳහන් අල්කුර්ආන් පාඨයන් තහවුරු කර සිටී.

"ඔහු සිය කැමැත්තෙන් කිසිම දෙයක් ප්‍රකාශ නොකරන්නේය. වහී මගින් දැනුම් දුන් දෑ හැර" (අල්-කුර්ආනය)

"අල්ලාහ්ගේ දූතයා ළඟ ආකර්ශනීය ආදර්ශයන් ඇත්තේය" (අල්කුර්ආන්)

<u>අභ්‍යාසය</u>

කෙටි පිළිතුරු සපයන්න.

1. අස්සිහාහුස් සිත්තා යයි හඳුන්වනු ලබන්නේ කුමක් ද?
2. හදීස් යන්නෙහි තේරුම ලියන්න.
3. සුන්නාව නීතිමූලාශ්‍රයක් ලෙස පිළිගත හැකි හේතු කවරේද?
4. හදීස් ග්‍රන්ථාරූඪ කරනු ලැබුවේ කවිරුන්ගේ කාලවකවානුවේද?
5. සුන්නාන්ව පිළිපැදීමෙන් ලැබෙන ආනිසංස ගොනු කරන්න.

## 6.3 ඉජ්තිහාද්

එක් ආගමික ප්‍රශ්නයකට පැහැදිලි නීතියක් නොතිබෙන අවස්ථාවක දී ඒ පිළිබඳ විනිශ්චයක් ලබා ගැනීම සඳහා නීති විශාරදයෙකු, ෂරීආ නීති මූලාශ්‍රයන් සහ නීති කෙටුම් පත් ඒ ආකාරයෙන්ම හදාරා තමාගේ මුළු වෙහෙසම දැරීම "ඉජ්තිහාද්" යනුවෙන් හැඳින්වේ. ඉජ්තිහාද් යන වචනය ජුහුද් යන අරාබි වචනයෙන් සෑදු වචනයකි.

"ඉජ්තිහාද් සාර්ථක වුව හොත් ආනිශංස දෙකක් තිබෙන අතර අසාර්ථක වුව හොත් ඔහුගේ උත්සාහයට ආනිශංස එකක් ලැබේ," යැයි නබි (සල්) තුමා පවසා ඇත.

පහත සඳහන් සාධක සැලකිල්ලට ගැනීමෙන් ඉජ්තිහාද් හි අවශ්‍යතාවය වටහා ගනු ලබන්නේය.

01. අල්කුර්ආනය, සුන්නාවේ නීති වාක්‍ය සොයා ඒ මගින් නීති මාලාව සකසා ගැනීම.

02. විවිධ මතයන්ට අනුකූලව උචිත දෑ තෝරා බේරා ගැනීම.

03. අල්කුර්ආනය හා සුන්නාවෙහි ඍජු විනිශ්චය ලබානොදුන් දෑ වලට විනිශ්චයක් ලබා ගැනීම.

ඉජ්තිහාද් ඉස්ලාමීය නීති මූලාශ්‍රයේ සජීවී බව රැකීමට අත්‍යාවශ්‍ය වන්නේය. සමාජ වෙනස්වීම් වලට යටත් වූ ගැටළුවලට විනිශ්චය ලබා ගැනීමට ඉජ්තිහාද් මගින් අවසරය ලබා දී ඇත. මෙහි ඉජ්මාඃ, කියාස් යන නීති සම්පාදන ක්‍රම දෙකක් වෙන්කර හඳුනාගෙන ඇත. ඉජ්මාඃ හා කියාස් නීති ක්‍රම කාල වෙනස්කම් වලට අනුව ඉස්ලාම් නීති සංග්‍රහය, නම්‍යශීලි බවට කදිම නිදසුනකි.

**ඉජ්තිහාද් ලබා දෙන්නෙකුට තිබිය යුතු සුදුසුකම්**

ඉජ්තිහාද් එක් ආගමික කටයුත්තක් නිසා එය ඉතා පවිත්‍රව ඉටුකළ යුතුය.

**සුදුසුකම් :**

1. මුස්ලිම්වරයෙකු වීම හා වැඩිවියට පත්වී සිටිය යුතුයි.
2. ඉජ්තිහාද් කරනු ලබන අදාළ කරුණ සම්බන්ධව කුර්ආන් හදීස්වල සාධක නිසියාකාරව දැන සිටීම.
3. පොදුවේ අල්කුර්ආන් හා හදීස් සම්බන්ධ කලාවන් පිළිබඳවත්, ඉල්මුල් කියාස්, උසූලුල් ෆික්හ් ආදී කොටස් පිළිබඳවත් මනාව දැන සිටීම.
4. පෙර ලබාදුන් ඉජ්මාඃ විනිශ්චයන් ගැන මනා අවබෝධයක් තිබීම.
5. නීති කෙටුම් පත් මූලාශ්‍ර ක්‍රම විධි සම්බන්ධව අවබෝධයක් ලබා තිබීම.
6. අරාබි භාෂාවහි මනා නිපුණත්වයක් හෙබි හා ඉජ්තිහාද් කරනු ලබන කාල වකවානුවෙහි මිනිස් ජීවිත රටාව පිළිබඳ දැනුවත්ව සිටීම.
7. යුක්තිගරුක භක්තිවන්ත හා මනා හැසිරීමක් යුක්ත වූ කෙනෙකු විය යුතුයි.

ඉජ්තිහාද් යන්නෙහි අර්ථය තේරුම් ගැනීම සඳහා ඉමාම් සෞකානි විසින් ලබා දී ඇති පහත සඳහන් අර්ථ කථනය ඉතා උචිත වූ එකක් යැයි නවීන ලොකයේ ශ්‍රේෂඨ වූ මුජ්තහිද්වරයෙකු වන ආචාර්ය යූසුෆ් අල් කර්ලාවි පවසයි.

"ඉස්ලාමීය පදනම් මූලාශ්‍රයන්ගෙන් ගැඹුරු අදහස් වලින් ෂරිආවේ අන්තර්ගත වූ වර්තමාන ගැටළු සඳහා විනිශ්චය ලබා ගැනීමට නීති විශාරදවරයෙකු තමන්ගේ හැකියාව උපයෝගි කර ගැනීම ඉජ්තිහාද් වේ"

අබූසහ්රා පෙර ඉමාම්වරුන්ගේ අදහස් අනුව ඉජ්තිහාද් ගැන මෙසේ විග්‍රහ කරයි. එක් අදාල වූ ප්‍රශ්නයකට පැහැදිලි විනිශ්චය ලබා පැහැදිලි කිරීමට එම විනිශ්චය සමාජයේ ක්‍රියාවට නැංවීමටත් එක් නීති විශාරදයෙක් ගන්නා පියවර ඉජ්තිහාද් වේ.

<u>අභ්‍යාසය</u>

කෙටි පිළිතුරු සපයන්න.

1. ඉජ්තිහාද් යනු කුමක්ද?
2. ඉජ්තිහාද් අවශ්‍යවන්නේ ඇයි ? හේතු දක්වන්න.
3. ඉජ්තිහාද් ලබා දෙන්නෙකුට තිබිය යුතු සුදුසුකම් මොනවාද?

# 6.4 ඉජ්මාඋ හා කියාස්

## ඉජ්මාඋ

ඉජ්තිහාදය මගින් ලබාගන්නා පළමු උප මූලාශ්‍රය "ඉජ්මාඋ" වන්නේය. නබි (සල්) තුමාණන්ගේ අභාවයට පසු සහාබාවරුන් එකල පැන නැගුණු නොයෙකුත් අලුත් ගැටළුවලට ඉජ්මාඋ මගින් විසඳුම් සොයා ගත්හ. අදාල ගැටළුව පිළිබඳ සියලු මුජ්තහිද්වරුන් ඒකමතිකව තීරණයකට එළැඹීම "ඉජ්මාඋ" වන්නේ ය. එසේම එම මුජ්තහිද්වරුන්ගෙන් යම් කෙනෙකු වෙනස් මතයක් දරමින් අදහස් ප්‍රකාශ කිරීමෙහි යෙදුණද, එම තීන්දුව අවලංගු වන්නේය.

"ඉජ්මාඋ" නමැති අරාබි වචනය අජ්මඅ නමැති වචනයෙන් උපුටා ගන්නා ලද්දකි. එකලස් කිරීම, නිශ්චය කිරීම, ඒකමතිකව පිළිගැනීම, යනුවෙන් අර්ථ දැක්වීම සඳහා මෙම පදය යොදා ගැනේ. ඉස්ලාමීය ෂරීආවේ පහත සඳහන් ලෙස "ඉජ්මාඋ" නම් පදය උපයෝගී කර ගනු ඇත.

යම් ගැටලුවකදී සියලුම මුජ්තහිද්වරුන් කිසිම විරුද්ධත්වයක් හා වැරදි වැටහීමකින් තොරව ඒකමතිකව තීරණයකට එළඹෙන්නේ නම් එය "ඉජ්මාඋෂ් ෂරීහ්" (පැහැදිලි ඉජ්මාඋව) යයි හඳුන්වති. යම් ගැටලුවකදී බහුතරය තීරණයකට එළඹ සුළුතරය එම තීරණය හෝ විනිශ්චය ගැන කිසිවක් ප්‍රකාශ නොකර නිශ්ශබ්දව සිටි නම්, එය "ඉජ්මාඋස්සුකූති" (නිශ්ශබ්ද ඉජ්මාඋව) යැයි පැවසේ. මේ ඝණයට අයත් ඉජ්මාඋව සමහර නීති විශ්ලේෂකයින් මූලාශ්‍රයක් ලෙස උපයෝගී කර නොගනිති. මක්නිසාද යත්, නිශ්ශබ්දතාවය අවනතවීමේ සලකුණ වුවද, භය හේතුකොටගෙන නිශ්ශබ්දව සිටිය හැකි යන්න මොවුන්ගේ වාදයයි.

ඉජ්මාව නීති මූලාශ්‍රයක් ලෙස පිළිගත හැකි බවට සාධක ඇත.

"මගේ සමාජය වල්මත්වීමෙහිලා එක් නෙවෙයි" (තිර්මිදි) යන හදීසය හොඳ නිදසුනකි.

"ඔබ අල්ලාහ්ට අවනත වන්න. ඔහුගේ දූතයාටද අවනත වන්න. තවද ඔබලාගෙන් අල්ලාහ්ට හා ඔහුගේ රසූල්ට අවනතවන්නන්ටද කීකරුවන්න. (4 : 59)

## අල්කියාස්

"කියාස්" ඉස්ලාමයේ ඊළඟ උප මූලාශ්‍රය වන්නේය. කියාස් යන පදෙහි තේරුම සසඳා බැලීම, උපකල්පනය කිරීම යන්නය. කියාස් යනු ඉස්ලාමීය ව්‍යවහාරයේ දී අල් කුර්ආන්, සුන්නාව, ඉජ්මාඋ යන නීති මූලාශ්‍රයන්ගෙන් හෝ ඒවායින් එකක් මගින් ඒ වන විටත් ලබා දී තිබූ තීන්දුව පදනම් කර අලුත් ප්‍රශ්නයක් සම්බන්ධව සසඳා බලා ලබාගන්නා තීරණය වන්නේය. කියාසය සාමාන්‍ය ජනතාවට කළ නොහැක්කකි. ඉස්ලාමීය නීතිවේදීන් පමණක් එය කළ යුතු වේ.

ජුම්ආ දවසේ දී සලාතය සඳහා ඇරයුම් කරන විට තම ව්‍යාපාර කටයුතු නවත්වා ජුම්ආ සලාතය ඉටු කරන්නැයි යනුවෙන් අණ කරන කුර්ආන් වැකිය වෙළඳාම් කටයුතු මගින් ජුම්ආ සලාතයට හානි පමුණුවිය හැකි බැවින් එම වේලාවන්හි ව්‍යාපාර කටයුතුවල යෙදීමද හරාම් කළේය. මෙමගින් ජුම්ආ සලාතයට වින කළ හැකි ඕනෑම කටයුත්තක් හරාම් යැයි සසඳා බලා තීරණයකට එළඹී ඇත්තේය. අල්කුර්ආනයෙහි හා සුන්නාවෙහි කියාසයට නොයෙකුත් සාධක දක්නට ලැබේ.
"කවුරුන් ආරම්භයේදී මැව්වේ ද, ඔහු විසින්ම නැවත පණ දෙනු ලබන බව පවසන්න."

මෙම වාක්‍යයෙන් ශුන්‍ය වූ තත්ත්වයක සිට මිනිසාව දෙවියන් වහන්සේ මැව්වේය යන්නද, මිනිසා මරණයට පත්ව, පස සමඟ මිශ්‍රවී යාමෙන් පසුද නැවතත් ඔහු ප්‍රාණය දෙනු ලබන්නේය, යැයි සසඳා බලනු ඇත.

එක්තරා කාන්තාවක් නබිතුමා වෙත පැමිණ හජ් යුතුකම ඉටුකිරීම සඳහා පියාණන් රෝගාතුරවී සිටින විටදී තමාට එය ඉටුකළ හැකිදැයි ප්‍රශ්න කර සිටි විට, "පියාණන්ගේ ණය තුරුස් පියවීම ඔබේ යුතුකම නොවේද? යයි සඳහන් කර මිනිසාට පියවිය යුතු ණයට වඩා අල්ලාහ්ගේ ණය පියවීම ඉතා අගනේය" යැයි සසඳ බලා නබිතුමන් පැහැදිලි කර දුන්හ.

මුආද් ඉබිනු ජබල් (රලි) තුමන්ව යෙමන් දේශයට පිටත් කර යැවූ නබි තුමන් එම රටවැසියන්ගේ ගැටළු ඔබ කෙලෙස නිරාකරණය කෙරෙන්නෙහිද? යැයි විමසූහ. එයට අල්කුර්ආනය මගින් යයි පිළිතුරු ලබා දෙන්නෙමි" යැයි පිළිතුරු දුන්නේය. "අල්කුර්ආනයෙහි විසඳුමක් නොලැබුණු විට කුමක් කරන්නෙහිද?" යැයි විමසා සිටි විට "සුන්නාව පාධක කරගෙන විසඳුම් සොයමි. "යැයි පිළිතුරු දුන්නේ ය." එලෙසද, විසඳුමක් සොයාගන්නට බැරිවූ විටකදී කුමක් කරන්නෙහිද?" යන්න විමසූ විට "අල්කුර්ආනයට හා සුන්නාවට පටහැනි නොවන ලෙස ස්වකීය චින්තයෙන් එම ගැටළු නිරාකරණයෙහි යෙදෙමි" යැයි පවසා සිටියේය. එම සිදුවීම ඉජ්තිහාදය අනුමැතිය ලද්දක්, බවට හොඳම නිදසුනකි.

### කියාස්හි අංග : (4 කි)

1. අල්-අස්ල් : (පාධකය හෝ උපමාව)

මෙය අල්කුර්ආන්, සුන්නා, ඉජ්මාඋ යනාදියෙන් අනුමතිය ලද නීති කොටසක් ලෙස දක්නට ලැබේ. නොයෙකුත් දෑ තහනමට ලක්ව ඇති විලාශය උදහරණ වශයෙන් පෙන්වා දිය හැක. ජුම්ආ සලාතයට කැඳවීම් කරනු ලැබීමෙන් පසු ව්‍යාපාර කටයුතු වලට යෙදීම තහනම් කර ඇත.

(එක් කියාස් නිගමනයක්, තව කියාසයකට පාධක කරගත නොහැක.)

2. අල්-ෆර්උ : (අධාරයකය හෝ කාරකය)

මෙය නොවෙනස් වන සුළු විය යුතු යැයි කියනු ලැබේ. නිදසුනක් වශයෙන් සලාතයට බාධක පැමිණිය හැකි නිසා ව්‍යාපාර කටයුතු හරාම් කරනු ලැබ ඇත.

3. අල්-හුකුම් : (තීන්දුව)

කිසියම් නීතියක් භාවිතාවෙහි දක්නට තිබිය යුතුය. තීන්දුව විචාර බුද්ධියට අනුකූල විය යුතුය. නිදසුන් : ජුම්ආ වෙලාවන්හි ව්‍යාපාර කටයුතු හරාම්, යැයි තීන්දුවක් ලබාදී ඇති බවය.

4. අල් ඉල්ලත් : (තීන්දුවට පාදක හේතුව)

මෙය ප්‍රධාන ගැළුවට ලබාදුන් තීන්දුවට පාදකවන හේතුව සඳහන් කිරීමකි. ඉහත නිදසුනට අනුව ලබාදී ඇති තීන්දුවට හේතුව වනාහි ජුම්ආ සලාතයට ව්‍යාපාරය බාධකයක් වීමය. මෙම කරුණු අල්-කුර්ආන්, සුන්නාහ්, ඉජ්මා, යනාදියෙන් ලබාගත්තක් හෝ බුද්ධිමය හේතු සාධකයක් වීම වැදගත් කොන්දේසියකි.

ඉජ්මා සාමූහික ප්‍රයත්නයක් ලෙසද, කියාස් සාමූහිකව හා තනිව ලබාගන්නා ප්‍රයත්නයක් ද වන්නේය. මේනිසා ඉස්ලාමීය ඉතිහාසයේදී කියාස් අධික වශයෙන්ද ඉජ්මාව සුළු වශයෙන් ද භාවිතා කර ඇති බව පෙනේ.

**අභ්‍යාසය**

1. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   - i. ඉජ්මාඋ යනු කුමක් ද? පැහැදිලි කර එහි කොටස් ද විස්තර කරන්න.
2. i. කියාස් යනු කුමක් ද?
   - ii. කියාස් පාධක කොට තීන්දු ලබාගන්නා ක්‍රමය පැහැදිලි කර ඉස්ලාමීය නීති සම්පාදනයේ කියාස්හි වැදගත්කම ගැනද පැහැදිලි කරන්න.